අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන්
තනතුරුවලට පත්කිරීම - 2026

1925/37 හා 2015.07.28 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ සහ එයට වරින්වර සිදු කරන ලද සංශෝධනවල සඳහන් පරිදි අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල සහ ගුරු විද්‍යාල වල 2026.06.30 දිනට උපලේඛන I හි සඳහන් තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් වෙතින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර "ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, ගුරු අධ්‍යාපනඥ ශාඛාව, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල" වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත්කිරීම - 2026 " යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

I. තනතුරු :
   I. **ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පීඨාධිපති**
   II. **ගුරු විද්‍යාල විදුහල්පති**
   III. **ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ උප පීඨාධිපති**

II. **අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය - 2026.11.13**

III. ලියාපදිංචි තැපෑලට යොමු කිරීමට ප්‍රථම සම්පූර්ණ කරන ලද ඔබගේ අයදුම්පතේ ස්කෑන් පිටපතක් (Scan Copy) පහත ආකාරයට විද්‍යුත් තැපෑලෙන් ද යොමු කළ යුතු වේ.

E- mail = sltesrecruitemant@gmail.com
Subject = Appointment of the Officers in Grade I of the Sri Lanka Teacher Educators' Service to the Posts – 2026 (Name & ID No)

**02. තෝරා ගැනීමේ ක්‍රමය :**

I. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1925/ 37 සහ 2015.07.28 වැනි දින අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවේ 11 වන ඡේදය අනුව ඉහත තනතුරු සඳහා සුදුසුකම් සහිත නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් විසින් ලබාගන්නා ලකුණුවල ප්‍රමුඛතාව මත, අයදුම්කරුගේ මනාපය හා සේවා අවශ්‍යතාවය පරිදි අධ්‍යාපන ලේකම්ගේ නිර්දේශය ද සැලකිල්ලට ගනිමින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් තනතුරුවලට පත්කරනු ලැබේ.

II. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථාවේ උපලේඛනය V පරිදි, අදාළ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ලබනුයේ ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණයේ දී අවම සමත් ලකුණු ප්‍රමාණය වන ලකුණු 35ක් හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගන්නා නිලධාරීන් පමණි.

III. ව්‍යූහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමේ ක්‍රමය මෙම නිවේදනයේ උපලේඛනය II යටතේ දක්වා ඇත.

IV. ඉල්ලුම් කිරීමට කැමති සේවා ස්ථාන සහ තනතුරු අපේක්ෂිත අනුපිළිවෙළට අනුව අයදුම්පත්‍රයේ අංක 08 යටතේ සඳහන් කළ යුතුය. කුසලතාවය අනුව ඔබ විසින් ඉල්ලුම්කරන ලද තනතුරේ සුදුසුකම් නොලබන්නේ නම් සේවා අවශ්‍යතාවය මත වෙනත් සේවා ස්ථානයක තනතුරක් සඳහා පත් කිරීමට සලකා බලනු ලැබිය හැකිය.

V. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම්ගේ අංක ESC/APP/SLTES/10/175/2017 දරණ 2021.02.23 දිනැති ලිපිය අනුව නිට්ටඹුව සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ පීඨාධිපති තනතුර සඳහා ඉල්ලුම් කිරීමේ හැකියාව පවතින්නේ භික්ෂූන් වහන්සේ නමකට පමණක් වන අතර උප පීඨාධිපති තනතුර සඳහා භික්ෂූන් වහන්සේලා හා ගිහි පිරිමි නිලධාරීන්ට පමණක් ඉල්ලුම් කිරීමේ හැකියාව පවතී.

VI. පත්කිරීම් කරන ලද තනතුරක වැඩ භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමට නිලධාරියාට අවස්ථාවක් ලබා නොදෙන බැවින් පත්වීම් ලද තනතුරේ අනිවාර්යයෙන් රාජකාරියට වාර්තා කළ යුතුය.

VII. අයදුම්පත්‍රයේ සඳහන් මනාප හා අනුපිළිවෙල පසු අවස්ථාවක වෙනස් කර ගැනීමට අවස්ථාවක් නැත.

VIII. මෙම සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගන්නා කුසලතාව අනුව තනතුරක් ලබා දීම සඳහා සලකා බලනුයේ මෙම අදියර සඳහා පමණි.

IX. පරිපාලන පහසුව සඳහා තනතුරු සිංහල හා දෙමළ මාධ්‍ය වශයෙන් වෙන් කර පැවතිය ද අදාළ මාධ්‍යයෙන් සේවය කිරීමට හැකි ඕනෑම නිලධාරියකුට පුරප්පාඩු සඳහා ඉල්ලුම් කිරීමට හැකියාව පවතී.

X. අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් හෝ ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් හෝ යම් වැරදි කරුණක් ඕනෑකමින් යටපත් කර ඇත්නම් හෝ තනතුරෙන් පහ කිරීමට ඉඩ ඇත.

03. **සුදුසුකම් :**

I. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ 03 වන කාර්යක්ෂමතා කඩඉම සමත් I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.

II. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනය නිකුත් කරන දිනට පූර්වාසන්න වසර 05 ක කාලය තුළ සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබීම.

04. අදාළ වහුහගත සම්මුඛ පරීක්ෂණය බත්තරමුල්ල, ඉසුරුපාය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී පැවැත්වේ. සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ. මෙම තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

05. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

නාලක කලුවැව

ලේකම්

2026 ඔක්තොම්බර් මස ...13... වන දින

උප ලේඛන I

# ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත් කිරීම සඳහා පවතින සහ ඉදිරියේදී පුරප්පාඩු වන තනතුරු සහ සේවා ස්ථාන ( 2026.06.30)

I. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ :

| අනු අංකය | ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | පීඨාධිපති තනතුරු | | උප පීඨාධිපති තනතුරු | |
|---|---|---|---|---|---|
| | | සිංහල | දෙමළ | සිංහල | දෙමළ |
| 1. | ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 02 | - |
| 2. | නිල්වලා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 03 | - |
| 3. | සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, නිට්ටඹුව | 01 | - | 03 | - |
| | සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, දඹදෙණිය | | - | 02 | - |
| 4. | සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 02 | - |
| 5. | මහවැලි ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 03 | - |
| 6. | වවුනියාව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | - | 03 |
| 7. | ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | 01 | 02 | 03 |
| 8. | අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | 01 | - | 02 |
| 9. | මඩකලපුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | - | 03 |
| 10 | පුලතිසිපුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 03 | - |
| 11. | රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | | 03 | - |
| 12 | රුහුණු ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | | 02 | - |
| 13 | යාපනය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | 01 | - | 03 |
| 14 | දර්ගානගර් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | 01 | - | 03 |
| 15 | මහරගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 02 | - |
| 16 | හාපිටිගම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 03 | - |
| 17 | පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 03 | - |
| 18 | වයඹ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | - | - | 02 | - |
| 19 | පේරාදෙණිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | 01 | - | 03 | - |
| 20 | කුලියාපිටිය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය | | - | 02 | - |

I. ගුරු විද්‍යාල :

| අනු අංකය | ගුරු විද්‍යාලය | ගුරු විද්‍යාල විදුහල්පති | |
|---|---|---|---|
| | | සිංහල | දෙමළ |
| 01 | බලපිටිය ගුරු විද්‍යාලය | 01 | |
| 02 | ගම්පොළ ගුරු විද්‍යාලය | 01 | |
| 03 | ගිරාගම ගුරු විද්‍යාලය | 01 | |
| 04 | කොටගල ගුරු විද්‍යාලය | | 01 |
| 05 | මඩකලපුව ගුරු විද්‍යාලය | | 01 |
| 06 | අඩ්ඩාලච්චෙන ගුරු විද්‍යාලය | | 01 |
| 07 | කෝප්පායි ගුරු විද්‍යාලය | | 01 |

උපලේඛනය II

## ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත්කිරීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා වන ලකුණු ලබා දීමේ පරිපාටිය - 2026

**01. ජ්‍යෙෂ්ඨතාවය : උපරිම ලකුණු 50**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ සේවා කාලය සඳහා 1 ශ්‍රේණියට උසස්වූ දින සිට ලකුණු ලබාදීම සිදු කරන අතර ලබා දෙනු ලබන ලකුණු ප්‍රමාණය, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 අනුව තිරණය කරනු ලැබේ. එනම් වැඩිම සේවා කාලයක් සහිත නිලධාරියාට සේවා පළපුරුද්ද සඳහා වෙන් කර ඇති මුළු ලකුණු ප්‍රමාණයද සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස I ශ්‍රේණියේ සේවා කාලය සඳහා ලකුණු ලබාදීමද සිදු කරනු ලැබේ.

**02. අතිරේක අධ්‍යාපන සුදුසුකම් : උපරිම ලකුණු 12**

මෙම සම්මුඛ පරීක්ෂණයේ මූලික සුදුසුකමක් ලෙස සලකා බලනු ලබන 3 වන කාර්යක්ෂමතා කඩඉමේදී අදාළ කර ගන්නා අධ්‍යාපන සුදුසුකම් හැර රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි සඳහන් විධිවිධානවලට අනුකූලවන පහත සඳහන් අතිරේක අධ්‍යාපන සුදුසුකම් අතුරින් ඉහළම අතිරේක අධ්‍යාපන සුදුසුකමක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| I. | දර්ශනශූරි (PhD ) | - ලකුණු 12 |
| I. | දර්ශනපති (M Phil) | - ලකුණු 10 |
| II. | පශ්චාත් උපාධිය (MA, MSc, MBA, Med, MATE.....) | - ලකුණු 08 |
| III. | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | - ලකුණු 06 |

තව ද, අයදුම්කරුවන් විසින් ඒ බව අදාළ ලේඛනවල සනාථ කර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී පමණක් ඉදිරිපත් කළ යුතුය. පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන පිළිගනු නොලැබේ.

**03. සන්ධාන භාෂා ප්‍රවීණතාවය: උපරිම ලකුණු 06**

අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව ලබා දෙනු ලබන මාතෘකා කිහිපයක් අතුරින් අහඹු ලෙස තෝරා ගනු ලබන මාතෘකාවක් යටතේ මිනිත්තු 03 ක කාලයක ඉදිරිපත් කිරීමක් ඉංග්‍රීසි මාධ්‍යයෙන් කළ යුතු අතර ඒ සඳහා පහත නිර්ණායක යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

| | | |
|---|---|---|
| I. | විෂයය අන්තර්ගතය | - ලකුණු 2 |
| II. | ඉදිරිපත් කරන විලාසය | - ලකුණු 2 |
| III. | භාෂාව හැසිරවීම | - ලකුණු 2 |

04. තොරතුරු සන්නිවේදන හැකියාව : උපරිම ලකුණු 02

මාස 6 ක් හෝ පැය 720 ක් හෝ ඊට වැඩි තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය පිළිබඳ හදාරන ලද පාඨමාලාවක් සඳහා

තවද, මෙහිදී ඉදිරිපත් කරන සහතික පත්‍රවලට ලකුණු ලබා දෙනුයේ සහතික පත්‍රයේ හෝ විස්තරාත්මක ලකුණු ලේඛනයේ (Transcript වල) අදාළ පාඨමාලාවේ කාලය සඳහන් වන්නේ නම් පමණි.

05. විෂයය බාහිර ක්‍රියාකාරකම් හා ජයග්‍රහණ : උපරිම ලකුණු 10

I. ක්‍රීඩා/නාට්‍ය/කලා උළෙල හෝ බාලදක්ෂ/ශිෂ්‍යභට/ එඩින්බරෝ ආදී අවස්ථාවන්හි දී ගුරු ශික්ෂණලාභීන් / ගුරු සිසුන් මෙහෙයවා ලබා ගත් සාර්ථකත්වයන් සඳහා ලද ඇගයීම් /ප්‍රශංසා සහතික හෝ ගුරු අධ්‍යාපන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් කරන ලද නව නිර්මාණ / සුවිශේෂී දායකත්වයන් වෙනුවෙන් ලබා ගත් සහතික.

[අධ්‍යාපන ලේකම්/ප්‍රධාන කොමසාරිස් විසින් නිකුත් කර ඇති හෝ යම් පනතකින් ස්ථාපිත කර ඇති ආයතනයකින් හෝ රජයේ අනුබද්ධිත ආයතනයකින් හෝ රජයේ පිළිගත් ජාත්‍යන්තර ආයතනයක ප්‍රධානියකු විසින් නිකුත් කරන ලද සහතික සඳහා (මෙහිදී තහවුරු කළ හැකි ලේඛන ඉදිරිපත් කළ යුතු අතර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ යම් අවිනිශ්චිතතාවයක් මතු වුව හොත් අදාළ ආයතන වලින් විමසා එම ලබා දෙන ලකුණු පිළිබඳ අවසාන තීරණයකට එළඹෙනු ඇත.)]

එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික 04 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

-ලකුණු 08

II. අධ්‍යාපන ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පොදු 230 බී ප්‍රශංසා හා දෝෂ දර්ශන ආකෘතිය අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් - ලකුණු 02

(දෙපාර්තමේන්තු ප්‍රධානියා යනු ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) වේ.)

එකකට ලකුණු 1 බැගින් උපරිම සේවා ඇගයීම් 2 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

**(ඉහත 05.I හි සඳහන් කාර්යයක් සඳහා කරනු ලබන සේවා ඇගයීම් මේ යටතේ සලකා බලනු නොලැබේ.)**

06. **පර්යේෂණ හා ප්‍රකාශන :** **උපරිම ලකුණු 15**

**අ) . පර්යේෂණ** **- ලකුණු 05**

පශ්චාත් උපාධියට/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර ප්‍රසිද්ධ පර්යේෂණ සාකච්ඡා මණ්ඩපයකට (Research Symposium) ඉදිරිපත් කරන ලද හෝ පර්යේෂණ සඟරාවක (Research Journal) පළ කරන ලද පර්යේෂණ වාර්තා 01ක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

I. තනිපුද්ගල පර්යේෂණ වාර්තා - ලකුණු 05

II. කණ්ඩායම් පර්යේෂණ වාර්තා - ලකුණු 03

(ප්‍රසිද්ධ සාකච්ඡා මණ්ඩපයක් යනු පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ විද්වතෙකු හා පර්යේෂණ සිදු කරන ලද ක්ෂේත්‍රයට අදාළ විද්වතෙකු සහ අවම මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගෙන්වත් සමන්විත මණ්ඩපයක් ලෙස මෙහිදී සලකනු ලැබේ.)

ආ) . ප්‍රකාශන - ලකුණු 10

I. විෂයානුබද්ධව නිකුත් කරන ලද ජාත්‍යන්තර ප්‍රමිත පොත් අංකයක් (ISBN) හෝ ජාත්‍යන්තර වාර සඟරා අංකයක් (ISSN) ලද ප්‍රකාශනයක් සඳහා.(තනි පුද්ගල කතෘ හිමිකාරිත්වයක් දරණ පොත් හා සඟරා සඳහා පමණක් ලකුණු ලබා දීමේ දී සළකා බලනු ලැබේ.)

   එකකට ලකුණු 04 බැගින් උපරිම 01ක් සඳහා

II. විෂයානුබද්ධව නිකුත් කරන ලද ජාත්‍යන්තර ප්‍රමිත පොත් අංකයක් (ISBN) ලද ප්‍රකාශනයක පරිච්ඡේදයක් හෝ කතෘ හිමිකාරිත්වය සහිත ප්‍රකාශයට පත් කරන ලද තීරක සඟරා (Refereed Journals) (පරිච්ඡේදය හෝ තීරක සඟරාව සඳහා තනි පුද්ගල කතෘ හිමිකාරීත්වයක් තිබිය යුතුය.)

   එකකට ලකුණු 02 බැගින් උපරිම 02ක් සඳහා

III. කතෘ හිමිකාරිත්වය සහිත ප්‍රකාශයට පත් කරන ලද සාරාංශ (Abstracts) හෝ පුවත්පත් හෝ සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද විෂයානුබද්ධ ලිපි.

   එකකට ලකුණු 01 බැගින් උපරිම 02 ක් සඳහා

07. **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන සමස්ථ කුසලතාවය :** **උපරිම ලකුණු 05**

**මුළු ලකුණු 100**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත්කිරීම -2026

**ආදර්ශ අයදුම්පත්‍රය**

(A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපිටම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය සකස් කර ගත යුතුය)

01. (i) මුලකුරු සමග නම (සිංහලෙන්)
පූජ්‍ය ................................................................................................(හිමි/මයා/මිය/මෙනවිය)
මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
Rev/Mr/Mrs/Miss ................................................................................................

(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම :................................................................................

02. (i) රාජකාරී ලිපිනය : ................................................................................................
(ii) පෞද්ගලික ලිපිනය:................................................................................................

(iii) රාජකාරි දුරකථන අංකය: ......................................

(iv) පෞද්ගලික දුරකථන අංකය: ......................................
(v) විද්‍යුත් තැපැල් ලිපිනය : ..........................................

03. (i) උපන් දිනය : ......................................

(ii) ජාතික හැඳුනුම්පත් අංකය : ................................................

04. (i) මුල් පත්වීමේ දිනය හා ශ්‍රේණිය/පන්තිය : ................................................................
(ii) වර්තමාන ශ්‍රේණිය හා එයට පත් වූ දිනය : ................................................................
(iii) වර්තමාන සේවා ස්ථානය: ................................................................................

05. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :

(i) පළමු උපාධිය

| උපාධියේ නම සහ නිකුත්කළ ආයතනය | වලංගු දිනය | පන්තිය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ii) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

| සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය | පාඨමාලාවට ගත වූ කාලය හා වලංගු දිනය | විශිෂ්ඨ/ සම්මාන/ සාමාන්‍ය ද යන වග | විෂයයන් පිළිබඳ විස්තර |
|---|---|---|---|
| | | | |

(iii) පශ්චාත් උපාධි / වෙනත් ඉහළ උපාධි

| සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය | වලංගු දිනය | පන්තිය | විෂයයන් පිළිබඳ විස්තර |
|---|---|---|---|
| | | | |

(iv) කළමනාකරණය හෝ අධ්‍යාපන කළමනාකරණය හෝ පිළිබඳ ලබා ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව

| සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය | වලංගු දිනය | පන්තිය |
|---|---|---|
| | | |

(v) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :

..........................................................................................................................

..........................................................................................................................

(vi) වෙනත් වෘත්තීය සුදුසුකම් (ඩිප්ලෝමා සහතික හා පුහුණු ගුරු සහතික පිළිබඳ විස්තර)

| සහතිකයේ නම සහ නිකුත්කළ ආයතනය | පාඨමාලාවට ගත වූ කාලය | විෂයයන් පිළිබඳ විස්තර |
|---|---|---|
| | | |

**06. තොරතුරු සන්නිවේදන තාක්ෂණ හැකියාව පිළිබඳ විස්තර.**

| පාඨමාලා සහතිකය | නිකුත් කළ ආයතනය | පාඨමාලා කාලය | වලංගු දිනය |
|---|---|---|---|
| | | | |

**07. පළපුරුද්ද හා සේවා විස්තර** (කලින් දරන ලද තනතුරු හා එම තනතුරු දැරූ කාල පරිච්ඡේදයන් දින වකවානු සහිතව සඳහන් කරන්න.)

| සේවා ස්ථානය | තනතුර | ස්ථිර ද/ තාවකාලික ද | සිට | දක්වා |
|---|---|---|---|---|
| | | | | |

08. අපේක්ෂිත සේවා ස්ථාන සහ තනතුරු පිළිබඳ විස්තර.

| සේවා ස්ථාන | ඉල්ලුම් කරනු ලබන තනතුරු |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

සැ.යු. : නිවේදනයේ 01 ඡේදයේ දක්වා ඇති තනතුරු 03 සඳහා පමණක් මෙම සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත පත්කිරීම සිදු කරන බැවින්, එම තනතුරු පමණක් උපලේඛනය I සැලකිල්ලට ගෙන අපේක්ෂිත අනුපිළිවෙල අනුව ඉහත වගුවේ සඳහන් කරන්න.

09. විනය/ විමර්ශන තොරතුරු:-

9.1 කිසියම් වරදකට උසාවියකදී ඔබ වරදකරුවෙකු වශයෙන් තීරණය කර තිබේද? (එසේ නම් විස්තර සඳහන් කරන්න) ....................................................

......................................................................................................................

......................................................................................................................

9.2 දැනට ඔබට විරුද්ධව දෙපාර්තමේන්තුමය, විනයානුකූල පරීක්ෂණයක් පවත්වන්නේද? නැතහොත් අධිකරණය ඉදිරියේ නඩුවක් විභාග වෙමින් පවතී ද? ( එසේ නම් විස්තර සඳහන් කරන්න.) ......................................................................

......................................................................................................................

......................................................................................................................

මෙම ඉල්ලුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති සියළුම තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි දී සටහන් කර ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් ඒ මත මා මෙම තනතුර ලැබීමට නුසුදුස්සකු බවට තීරණය කරන බවත්, තනතුර ලැබීමෙන් පසු මෙහි සඳහන් තොරතුරු කිසිවක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව අනාවරණය වුවහොත් මා කිසිම වන්දියක් නොලබා තනතුරින් පහකිරීමට යටත් වන බවත් දනිමි.

..................                                    ....................................................

දිනය                                    අයදුම්කරුගේ අත්සන

**ආයතන ප්‍රධානියාගේ සහතිකය**

පූජ්‍ය ........................................................................ හිමි/මයා/මිය/මෙය*ගේ ඉල්ලුම්පත ඉදිරිපත් කරමි.

ඔහු/ඇය* මෙම ආයතනයේ ...................................................... වශයෙන් සේවය කරන බවත්,

මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි වන/නොවන* බවත්,

පසුගිය වසර 5 ක කාලය තුළ විනය දඬුවමකට යටත් වූ/නොවූ* බවත්,

දැනට විනය, විගණන සහ විමර්ශන කටයුත්තක් සිදු වන/නොවන* බවත්,

ඔහුගේ/ඇයගේ 2026.-------- (නිවේදන ප්‍රසිද්ධ කරන දිනය) දිනට පූර්වාසන්න වසර 5 ක සේවා කාලය සක්‍රීය හා සතුටුදායක වන/නොවන* බවත් දන්වමි.

*අනවශ්‍ය වචන කපා හරින්න.

දිනය : ...................

ආයතනය : .....................................................

....................................................

ආයතන ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව